116577
29/11/91

# අපරාධ පිළිබඳ බෞද්ධ සංකල්පය

# හා

# සිංහල සමාජ පාලනය

අංකය 01
10-4-1991
විභාග අංශය

ඒ. පී. එන්. ද. එස්. අභයසුන්දර

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා

මානව විද්‍යා අධ්‍යයනාංශයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

සඳහා ඉදිරිපත් කෙරෙන

පර්යේෂණ නිබන්ධය

CR
ලංකා

ලියාපදිංචි අංකය: ඒ. 15184

විභාග අංකය : එස්. පී. ඒ. 389

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,

ගංගොඩවිල,

නුගේගොඩ.

1991

116577

බාලේ පටන් මෙතුවක්

මා හට අකුරු උගන්වා ශිල්ප දුන්

සියලුම ගුරු මා පියවරුන්

කෘතවේදීත්වයෙන් සිහිපත් කරමින්

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා

මානව විද්‍යා අධ්‍යයනාංශයේ

මහාචාර්ය නන්දසේන රත්නපාල මහත්මාණන්ට

ගුරු බැතියෙන් පිදේ.

CR
ලංකා

## උපකාරානුස්මෘති

වැඩිදුර උගෙනීම සඳහා ඒ තුළින් සමාජයට යහපතක් කිරීම උදෙසා නිබඳ මා සත් මාර්ගයට යොමු කරන අප විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය නන්දසේන රත්නපාල මහත්මාණන්ට මුලින්ම මා හද ගෞරවය හා කෘතවේදිභාවය පිරිනමමි.

නිරතුරුව අධ්‍යාපනයේදී මෙන්ම ජීවන ගැටළු වලදී පවා උපදෙස් දෙන සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධාන එඩ්වින් ගණිහිගම මහතා ගුරු සෙනෙහසින් සිහි කරමි.

අප අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය බී.ඒ.ටෙනිසන් පෙරේරා මහතා, ස්වර්ණලතා පෙරේරා, නීටා රත්නපාල මහත්මීන්ද, සුනිල් ජයවර්ධන, ජයන්ත ජයසිරි, එම්.ඩබ්.ජයසුන්දර, විශේෂයෙන් ග්‍රන්ථ නාමාවලිය සැකසීමේදී උදව් කළ ඩබ්.ඇම්.ධනපාල, ජ.බී. දේශප්‍රිය යන මහතුන්ද, ශයාංජලී දේවිකා පෙරේරා මෙනෙවිය, ඒ.ජේ.නන්දාවතී කුමාරි මෙනෙවිය හා අනුරුද්ධිකා බුද්ධදාස මහත්මියටද මගේ ස්තූතිය හිමිවේ.

හිටපු ශාස්ත්‍ර පීඨාධිපති විමල් ජේ.බලගල්ල මහතා, හිටපු උපකුලපති එල්.පී.එන්.පෙරේරා මහතා, ලීලාරත්න කංකානම්ගේ මහතා අපගේ අධ්‍යාපනයට මැනැවින් අතහිත වූහ.

මගේ පියා වන විමල් අභයසුන්දර මහතා නොසිටින්නට මෙම ග්‍රන්ථය බිහිවීමට ඉඩකඩ නොතිබුණි. මගේ මව කල්‍යාණි අභයසුන්දර, අර්ජුන, පුලස්ති මල්ලීලා, සුභානි නංගී, දියනා හා බිරිඳ නයනා ද මට සිහිවේ.

මෙම කෘතිය ටයිප් කර දුන් රාණි ජයකොඩි, ස්වර්ණපාලි සමරසිංහ මහත්මීන්ද, නුවන් ගුණවර්ධන මහතාද, අනෙකුත් නිමහම් කටයුත්තේදී උදව් උපකාර කළ ජයතුංග අමරවීර, පුංචිබණ්ඩා ගල්ලබ, රංජිත් පලිහපිටිය, ආරියපාල පෙරේරා මහතා, නිමල් පෙරේරා හා රංජනි අත්කාද, සිරිසේන අයියා ද දයාවෙන් සිහි කරන්නෙමි.

වැලිතර ගම් පළාත් වාසී සැම දෙනාටද, නායක හිමිවරුන්, ග්‍රාමසේවකවරුන්, පොලිස් නිළධාරී මහතුන් යහ මට උදව් උපකාර කළ සියලුම භවතුන්ට මගේ හෘදයාංගම ස්තූතිය පුද කරන්නෙමි....

----------

<u>තරිකා ගේ සහතිකය</u>

මෙම පර්යේෂණ නිබන්ධය සමාජ විද්‍යා, මානව විද්‍යා හා අපරාධ විද්‍යා ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා සකස් වූවකි. මහාචාර්ය නන්දසේන රත්නපාල හා මහාචාර්ය එල්. පී. එන්. පෙරේරා යන මහතුන්ගේ අධීක්ෂණය යටතේ සම්පාදනය කරන ලද මෙහි අන්තර්ගත සෑම දත්තයක් හා මූලාශ්‍රයක් ම ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් හා ක්ෂේත්‍ර ගවේෂණයෙන් සොයා පිළියෙල කළ බව සහතික කරමි.

– තරීකා –

## ප ටු න


| | පිටු අංක |
|---|---|
| **පළමුවැනි අධ්‍යාය** | |
| හැඳින්වීම | |
| 1.1 පර්යේෂණයේ පරමාර්ථ | 1 - 3 |
| 1.2 විෂය රූපය | 3 - 5 |
| 1.3 ක්‍රමවේදය හා මූලාශ්‍ර | 5 - 11 |
| 1.4 ශ්‍රම සාඵල්‍යය | 11 - 12 |
| 1.5 තෝරාගත් නියැදිය | 12 - 13 |
| 1.6 මූලාශ්‍ර | 13 - 26 |
| **දෙවැනි අධ්‍යාය** | |
| බෞද්ධ නීති සම්ප්‍රදාය හා අපරාධ විද්‍යාව | 27 - 31 |
| 2.1 පාරාජිකා | 31 - 39 |
| 2.2 අධිකරණ සමථ | 39 - 41 |
| **තුන්වැනි අධ්‍යාය** | |
| බෞද්ධ ආකල්ප සහ චරියා ශෝධන ක්‍රියාවලිය | |
| 3.1 බෞද්ධ ආකල්ප | 42 - 43 |
| 3.2 බෞද්ධ සදාචාර | 43 - 45 |
| 3.3 සාරධර්ම හා දිව්‍යමය නීතිය | 46 - 49 |
| 3.4 සමාජමය වෙනස්කම් | 49 - 51 |
| 3.5 අනෝමිය සංකල්පය | 51 - 52 |
| 3.6 ධර්මතා කඩකිරීම් පිළිබඳ ආකල්ප | 52 - 53 |

පිටු අංක

| | |
|---|---|
| 3.7 සාරධර්මවල උභය අංශය | 53 - 54 |
| 3.8 බෞද්ධ සාරධර්ම | 54 - 59 |
| 3.9 බුද්ධ පිරියෙහි එක්සත් බව | 59 - 66 |
| 3.10 දම්සභා මණ්ඩපය | 66 - 70 |
| 3.11 සෙත් පිරිත් | 70 - 74 |
| 3.12 ආයුබෝවන් | 74 - 75 |
| 3.13 වන්දනාමාන | 75 - 80 |
| 3.14 සාරධර්ම හා බෞද්ධ සමාජය විග්‍රහය | 80 - 81 |

සිවුවැනි අධ්‍යාය

| | |
|---|---|
| 4.1 සමාජ පාලන අර්ථ නිරූපණ | 82 - 86 |
| 4.2 සිවුවණක් පිරිස | 86 - 89 |
| 4.3 බෞද්ධ ශික්ෂණ ක්‍රමය | 89 - 91 |
| 4.4 බෞද්ධ සමාජයේ මණ්ඩල විධිය | 91 - 93 |
| 4.5 සමාජ පාලනයේදී සීලයෙහි ඇති වැදගත්කම | 93 - 94 |
| 4.6 ගිහි සමාජය | 94 - 96 |
| 4.7 ගිහි විනය | 96 - 97 |
| 4.8 පෝය | 97 - 104 |
| 4.9 ආමගන්ධ | 104 - 106 |
| 4.10 පිරිහෙන කරුණු | 106 - 108 |
| 4.11 අපරාධ හා දඬුවම් | 108 - 110 |
| 4.12 දඬුවම් හා ප්‍රතිෂෙධ | 110 - 112 |
| 4.13 දැඩි දඬුවම් | 112 - 116 |
| 4.14 දෙතිස් දඬුවම් හා තෙතිස් අධිකරණ විධි | 116 - 118 |
| 4.15 සිංහලේ දඬුවම් | 118 - 119 |

| | | පිටු අංක |
|---|---|---|
| 4.16 | මරණ දඬුවම | 119 - 120 |
| 4.17 | මාඝාත | 120 - 125 |
| 4.18 | පස්මහ වරද | 125 - 127 |
| 4.19 | සොරකම | 127 - 130 |
| 4.20 | කාමමිථ්‍යාචාරය | 130 - 132 |
| 4.21 | ගණිකා වෘත්තිය | 132 - 134 |
| 4.22 | වියකීම් හා බොරුකීම | 134 - 137 |
| 4.23 | සුරාපානය | 137 - 139 |
| 4.24 | විශේෂ ව්‍යවස්ථා | 139 - 142 |
| 4.25 | සමාජ පාලනයෙහි බුද්ධාගමේ බලපෑම | 142 - 144 |
| 4.26 | ආරාමය ක්ෂේම භූමියකි | 144 - 151 |
| 4.27 | ගිහි පැවිදි සම්බන්ධතාව | 151 - 155 |


## පස්වැනි අධ්‍යාය

### පැරණි ගමක නව ගම් පොකුරක්


| | | |
|---|---|---|
| 5.1 | වැලිතොට | 155 - 156 |
| 5.2 | නයා අඬු ගල | 156 - 159 |
| 5.3 | මාදු ගඟ | 159 - 160 |
| 5.4 | වැලිතොට සේතුව සහ බළපිටි මුවදොර | 160 - 162 |
| 5.4.1 | ඓතිහාසික පසුබිම | 162 - 163 |
| 5.4.2 | සඳෙස් වැනුම් | 163 - 169 |
| 5.4.3 | වැලිතොට අම්බලම | 169 - 172 |
| 5.4.4 | වැලිතොට කොටමුණ | 172 - 174 |
| 5.5 | වැලිතොට නව ගම් පොකුර | 174 - 184 |

පිටු අංක

5.6 ප්‍රජා රටාව 184 - 185
5.6.1 පෙළපත් නම් 185 - 189
5.6.2 සලාගම 189 - 192
5.6.3 සලාගම බ්‍රාහ්මණ කොඩිය 192 - 196
5.6.4 රණ ශූරයෝ 196 - 201


## සවන අධ්‍යාය

### වැලිතොට ප්‍රජාව හා ආර්ථිකය

6.1.1 වැව්ලි 202 - 204
6.1.2 තුරුළු 204 - 206
6.1.3 තුරුළු දෙපාර්තමේන්තුව 206 - 207
6.1.4 මහබද්ද 207 - 211
6.1.5 තුරුළු කර්මාන්තය 211 - 215
6.2.1 පොල් කර්මාන්තය 215 - 219
6.2.2 පොල් උයන් 219 - 220
6.2.3 කොප්පරා 220 - 226
6.2.4 කොහු කර්මාන්තය 226 - 229
6.3.1 ධීවර කර්මාන්තය 229 - 234
6.3.2 වැල්ලේ වහර 234 - 238
6.3.3 කොසරුප් වහර 236 - 238
6.4 මුදල් පොලී කිරීම 238 - 243
6.5.1 සාම්ප්‍රදායික නොවන රැකියා 243 - 247
6.5.2 නව වෙළඳ පංතියක් 247 - 254
6.6.1 වලව් 254 - 255
6.6.2 මහ කප්පිණ වලව්ව 255 - 261

පිටු අංක


| | | |
|---|---|---|
| 6.6.3 | තවත් වලව් | 261 - 262 |
| 6.7 | ගෘහ නිර්මාණ | 262 - 265 |
| 6.8 | ලී කැටයම් | 265 - 268 |
| 6.9 | ප්‍රවාහන පහසුකම් | 268 - 270 |
| 6.10 | පවුල් සංස්ථාව | 270 - 276 |


සත්වැනි අධ්‍යාය

සමාජ පරිවර්තනයකට බලපෑ අමරපුර නිකාය.


| | | |
|---|---|---|
| 7.1 | අමරපුර සමාගම පිහිටුවීම | 276 - 280 |
| 7.2 | සිල්වත් සමාගම | 280 - 282 |
| 7.3 | මල්වත්තෙන් අඹගහ පිටියට | 282 - 283 |
| 7.4 | ශාසන විරෝධී සම්මතයක් | 283 - 287 |
| 7.5 | බුරුම රටින් උපසම්පදාව | 287 - 293 |
| 7.6 | අඹගහපිටි මහ වෙහෙර | 293 - 297 |
| 7.7 | අඹගහපිටියේ වාර්ෂික පිංකම | 297 - 301 |
| 7.8 | විහාරාරාම | 301 - 314 |
| 7.9 | අමරපුර නිකායේ කාර්යභාරය | 314 - 322 |
| 7.10 | ශ්‍රී ලංකා අමරපුර සංඝ සභාව | 322 - 324 |


අටවැනි අධ්‍යාය

බෞද්ධ පුනරුදය හා සමාජ ප්‍රගතිය.


| | | |
|---|---|---|
| 8.1 | අධ්‍යාපන ක්‍රමාවලිය | 325 - 326 |
| 8.2.1 | බෞද්ධ පාඨශාලා | 326 - 327 |

පිටු අංකය


| | | |
|---|---|---|
| 8.2.2 | අකුරු මඩුව හා ගුරු ගෙදර | 327 - 329 |
| 8.2.3 | ස්වභාෂා පාසල් | 329 - 331 |
| 8.2.4 | ඉංග්‍රීසි පාඨශාලා | 331 - 332 |
| 8.3 | පිරිවෙන් | 332 - 336 |
| 8.4 | මහ පඬිවරු | 336 - 339 |
| 8.5 | කාර්මික අධ්‍යාපනය | 339 - 341 |
| 8.6 | කලා ශිල්ප | 341 - 345 |
| 8.7 | බුද්ධි සංචිතය | 345 - 347 |
| 8.8 | බබස් වහර | 347 - 349 |
| 8.9 | දේවාල, කෝවිල් | 349 - 352 |
| 8.10 | පත්තිනි හාමිලා | 352 - 357 |
| 8.11 | ගැමි බුදු සමය | 357 - 360 |
| 8.12 | බෞද්ධ පුනරුදය | 360 - 364 |
| 8.13 | පානදුරේ වාදය | 364 - 367 |
| 8.14 | ජාතික නවෝදය | 367 - 371 |
| 8.15 | දේශපාලනඥයෝ | 371 - 377 |
| 8.16 | ග්‍රාම සංවර්ධන | 377 - 382 |
| | සමාහාරය | 383 - 395 |
| | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 396 - 411 |
| | BIBLIOGRAPHY | 412 - |

# පළමු වැනි අධ්‍යාය

## හැඳින්වීම

### 1. 1 පර්යේෂණයේ පරමාර්ථ.

දකුණු සිරිලක ජනජීවිතය වෙනස් කිරීමට හේතු වූ බලවේගයක් නිසා ශ්‍රී ලංකාවේ පොදු ජීවිතය තුළ මහා පරිවර්තනයක් සිදු කළ සාම්ප්‍රදායික ගම් පියසක් අළලා මෙම අධ්‍යයනය ඉදිරිපත් කරමි. ඒ ගම් පියස වැලිතොටයි. අග්‍රාහාර ගම්වරයක් වූ වැලිතොට පිළිබඳ ක්ෂේත්‍ර පර්යේෂණයක යෙදී එයින් ලබාගත් ප්‍රතිඵල ක්‍රම විද්‍යානුගතව පෙළ ගැස්වීම මෙහි පරමාර්ථ විය.

මුඛ්‍ය වශයෙන් මෙම උපාධි නිබන්ධය කොටස් දෙකකට බෙදනු ලැබේ. ශ්‍රී ලංකාවේ සමාජ පාලනය කෙරෙහි බුදු සමය කළ බලපෑම ගවේෂණය කිරීම පළමු වැනි කොටසේ අන්තර්ගතයයි, යථාර්ථවාදී බෞද්ධ සමාජයක් තුළ අපරාධ වැළැක්වීමේ කාර්ය පද්ධතිය සමාජ පාලන බලවේගයක් වශයෙන් ක්‍රියාත්මක වන්නේ දඬුවම් පැමිණවීමෙන් නොව, දඬුවම් ලැබීමට සුදුස්සන් වන පුද්ගලයන් අපගාමී චර්යාවලින් වළක්වා ලීමේ සිද්ධාන්තය මතයයි සනාථ කිරීමට යත්න දැරීමි.

බෞද්ධ චින්තනයේ දැක්වෙන හිරිඔතප් යන ලෝක පාලන ධර්ම පුද්ගලයා පාපභීරුක භාවයට යොමු කරවීමෙන් අසංවර දුශ්චරිතයන්ගෙන් මිදී සිටීමට පොළඹවනු ලබන ඉගැන්වීම් මෙහිදී විශේෂයෙන් ගවේශනය කරනු ලැබේ. ආදිම යුගයේ පටන් මේ වන තුරු බෞද්ධ සමාජය තුළ සිදුවී ඇති අපරාධ වල ස්වභාවය හා එම අපරාධ මර්දනය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාවලිය කාය දුශ්චරිත, වචී දුශ්චරිත, මනෝ දුශ්චරිත යන සමාජ විරෝධී චර්යාවන් සිදු වූ

අපුරු, පැවැති අයුරු, බැහැර කිරීමට ගත් පිළිවෙත සලකා බලනු ලැබේ.

පස් පව්, දස අකුසල්, පංචානන්තරිය වැනි ක්‍රියාවලින් පුද්ගලයන් මුදවා ගැනීමට දරන ලද දැයාමේදී බෞද්ධ අධිකරණ, සමථ නීති මාලාව උපයෝගී කර ගත් සැටියෙන් යථෝක්ත මතය සනාථ කිරීමට ඉවකඩ සැලසෙතැයි සිතමි. බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් වන දඬුවම් සහ එම දඬුවම් පැමිණවීමේ අරමුණු සුචරිතවත් සමාජයක් ගොඩ නැංවීමට එලදායී වශයෙන් හිතකර වී ඇති සැටි මෙයින් පැහැදිලි වනු ඇත.

කිසියම් හේතුවක් නිසා අපරාධයකට යොමු වූ පුද්ගලයා සදහට ම සමාජ සංස්ථාවෙන් වෙන් කොට තැබීමට වෑයම් නොකිරීම පිළිබඳ මානවීය ගුණාංගය විවරණය කිරීමට මෙහිදී අවස්ථාව සලසා ගත හැකිය.

භික්ෂූන් වහන්සේගේ හා පන්සලේ කාර්ය භාරය අපරාධ මර්දනයට හා ග්‍රාම සංවර්ධනයට බලපා ඇති සැටි නිදර්ශන සාධක කොටගෙන ඉදිරිපත් කරනු ලැබේ.

වර්තමාන සමාජයෙහි පැතිර පවත්නා ධර්මදේශනා, ධර්ම සාකච්ඡා, ශීල ව්‍යාපාර, විපස්සනා භාවනා අභ්‍යාස ආදිය ව්‍යාප්ත කිරීමට ඉදිරිපත් වූ විවිධ සංවිධාන වල පරමාර්ථය වන්නේ පව් නොකරන අධර්මයෙහි නොහැසිරෙන, දුශ්චරිතයෙහි නොගැලෙන, අවිනයෙහි බැඳී නොසිටින, පින් දහම් වල යෙදෙන, යුක්තිය සලකන, විනය ගරුක සංවරශීලි, සාධාරණ, සාධු සම්මත මිනිස් සමාජයක් ගොඩ නැංවීමය. එබඳු සමාජයක් තුළ අපරාධවලට ඇති ඉවකඩ ඉතා ස්වල්ප බව ගවේශනයෙන් පැහැදිලි කරනු ලැබේ. අපරාධ සහ දඬුවම්වල අර්ථ කථන වලින් සහ ඓතිහාසික තොරතුරු වලින් සනාථ කළ හැකි වර්තමාන යුගයේ ප්‍රචලිතව පවත්නා නව සමාජ විද්‍යාත්මක සිද්ධාන්ත තුලනාත්මක ව විමර්ශනය කිරීම මෙහි තවද නිමිත්තකි.

දෙවැනි කොටසේ ඇතුළත් වන්නේ වැලිතොට ගම් පියසෙහි සමාජ සංසිද්ධිය කෙරෙහි බල පෑ ආගමික වූ ද සාමයික වූ ද සමාජමය වූ ද සංස්කෘතිකමය වූ ද බලවේගයන්ගේ ඓතිහාසික සංවර්ධනයයි. එහි ඓතිහාසික සංවර්ධනයේ කාර්යභාරය ජාතික මට්ටමෙන් සැලසූ සමාජ වෙනස්වර ප්‍රාසංගික වශයෙන් සැලකිල්ලට භාජන කරන ලදී.

වැලිතොට උඩු පිටින් පෙනෙනුවට වඩා දිගු ඉතිහාසයක් ඇත්තකි. පුළුල් සමාජ වෙනස්වරක ප්‍රභවස්ථානයකි. බුදු සමය රැකගත් ආරක්‍ෂක භූමියකි. සාම්ප්‍රදායික ජීවන රටාවකට හුරුපුරුදු මෙහි වැසියන්ගේ චර්යා රටා ආචාර විචාර ආකල්ප විකල්ප අභිචාර විධි ජන චර්යා ධර්මතා සාරධර්ම ආදිය එකිනෙකට බැඳී පවතින අන්තර් ක්‍රියාවලියක සංයුතියකැයි හැඳින්වීම නිවැරදි යයි සිතමි. මෙම නිගමනයට එළඹීමේ දී විවිධ දත්ත වලත් කාර්ය සාධක වලත් ලිඛිතවූ ද වාචික වූ ද පාදක සටහන් එක් රැස් කරගන්නට සිදු විය. එක් විෂයයක් ගවේශණය කරගෙන යන විට ඒ තුළින් මතු වූ අනුවිෂයයන් ගණනාවක් උද්ගතවන්නට වූයෙන් ලබා ගත් තොරතුරු එකිනෙකට සසඳා ගලපා ගන්නා ලද්දේ මහත් දුෂ්කරතා සම්බාධක ගැටලු හා ගැටුම් වලට මුහුණ දීමෙනි.

## 1: 2 විෂය රූපය

පූර්ව නිගමනවලට එළඹීමෙන් පසු ගවේශන කාර්‍යයෙහි යෙදීම එතරම් හිතකර නොවේ. ඇතැම් විට විෂය රූපය පිළිබිඹු කරගැනීමේදී අතරමං වන්නට සිදුවන බැවිනි. මේ වූ කලී මවිසින් අත්දකින ලද්දකි. වැලිතොට ක්ෂේත්‍ර පර්යේෂණය සඳහා යොමුවන විට මන්දෝත්සාහී කරවන සුලු තොරතුරු අසන්නට ලැබිණ. ප්‍රදේශය සමීක්ෂණයක් සඳහා යායුතු තැනක් නොවෙතැයි ඇතැමෙකුගෙන් කියැවිණ. එහි වැසියන් නපුරු දරුණු සැහැසි නොඉවසන සුලු වහා කිපෙන සුළු ස්වභාවයෙන් යුක්ත බව බොහෝ දෙනාගේ මතය විය. එබැවින් ඔවුන් වෙත එළඹී මෙබඳු කාර්‍යයක් කිරීම සුකර නොවෙතැයි අසන්නට ලැබිණ. එහෙත් විෂය ප්‍රතිරූපයේ වැදගත්කම සලකා ඉදුරා මෙම කාර්‍යයෙහි යෙදිය යුතු බව තීරණය කරගන්නා ලදී.

කෙසේ වුවද ආනුභවික ක්ෂේත්‍ර පර්යේෂණ රීතිය වෙහිලා වඩාත් වැඩදායක වන බව තීරණය විය. "ගමක පර්යේෂණ පැවැත්වීමේදී එහි මිනිසුන් සමග වැඩ කිරීම සහ ජීවත්වීම ඉතාම හොඳ පර්යේෂණ ක්‍රමයයි. ගැමි ජීවිතයේ හා සමාජයේ හෝඩිය නැතිනම් දේශීය සමාජයේ සහ සංස්කෘතියේ ව්‍යාකරණය මැනවින් හැදෑරීමට මෙම ක්‍රමය වෙනුවට ආදේශකළ හැකි තවත් ක්‍රමයක් නැත. අසල තානායමක හෝ හෝටලයක හෝ ගමේ ප්‍රභූවරයකුගේ නිවාසයක හෝ නතරවීමේ පිළිවෙත ගමට පැමිණෙන පර්යේෂකයාගේ සංකල්පයෙන් බැහැරවී ගොස් ඇත. ගමක තොරතුරු සොයාගැනීමේ අධ්‍යයන චාරිකාවක යෙදෙන පර්යේෂකයාගේ කාර්යභාරය කඩදාසියට හා පැන්සලට සීමාවීම දැන් පොදු දැක්මකි. එහෙත් මෙය ඉක්මනින් බැහැරවිය යුත්තකි. පර්යේෂකයා වෙනස් කාර්යයක් කරන වෙනස් පුද්ගලයෙක් නොවේ. ඔහුගේ කාර්යය නම් මිනිසුන් තේරුම් ගැනීමයි. ඔවුන් සමග වැඩකිරීම හා ජීවත්වීම විනා මිනිසුන් තේරුම් ගැනීමට වෙනත් හොඳ මගක් නැත." [1]

මහාචාර්ය නන්දසේන රත්නපාල විසින් ඉංග්‍රීසි බසින් ලියන ලද පර්යේෂණ ක්‍රම විද්‍යාවේ නව නිම් වළලු නම් ග්‍රන්ථයෙහි දක්වන ලද ඉහත සඳහන් නිගමනය මෙම පර්යේෂණ කාර්යයේදී බෙහෙවින් අගය කළෙමි. වැලිතොට කළ සංචාරවලදීද ඔවුන් සමග වැඩ කිරීමේදීද ඔවුන් සමග වාසය කිරීමේදීද ලැබූ අනුභූති සමූහය කලින් පැවැති දුර්මත වෙනස් කරගැනීමට හේතු වූයේ ය. ඔවුන් ආගන්තුක සත්කාරය ප්‍රිය කරන සමීපවූ විට තරයේ ඇලුම් කරන යමක් ගැන විමසිලිමත්වන විට ඒ පිළිබඳව වඩ වඩා කරුණු කියාදීමට ගැඹුරින් විමසුම් නුවණ මෙහෙයවීමට කැමැති සතුටු සාමීචියට සුදුසු ප්‍රජා කණ්ඩායමක් වන බැවිනි.

සමාජ ව්‍යුහයේ එක් අංශුවක් පමණක් වන වැලිතොට සමාජයත් එහි පාලනයත් ක්‍රියාත්මක වූ අයුරු සමීක්ෂණය කිරීම සඳහා දරන ලද ප්‍රයත්නය

---

1. Dr. Nandasena Ratnapala : New Horizons in Research Methodology, Colombo, 1986, p. 29.